කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 දෙසැම්බර් - 2023 මාර්තු

සමාජීය විද්‍යා පීඨය

පුරාවිද්‍යාව (නව නිර්දේශය)

# අභිලේඛන හා නාණක විද්‍යාව ARCH – E 2025

ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

**පළමු ප්‍රශ්නයට පිළිතුරු ලබාදෙන්නේ නම් අදාළ සියලුම කොටස්වලට පිළිතුරු සපයන්න. එක් නිවැරදි පිළිතුරකට ලකුණු හතරක් (04) හිමි වේ. (නිවැරදි අදහස තේරුම් ගතහැකි පරිදි රචනයට ලකුණු තුනක් (03) ද නිවැරදි අක්ෂර රචනයට ලකුණු එකක්ද (01) බැගිනි.**

---

01. i) පහත දක්වා ඇති අභිලේඛන නූතන අක්ෂරයෙන් ලියා එහි අර්ථය ද ලියා දක්වන්න.

නැට්ටුක්කන්ද ලිපිය



169

වෙහෙර උඩ මලේ ලිපිය



No. 30

වල්ලිපුරම් රන් සන්නස



ii) පහත දක්වා ඇති ලේඛන තත්කාලීන අක්ෂරයෙන් ලියා දක්වමින් වර්තමාන බසට පරිවර්ථනය කරන්න.

මිහින්තලේ අංක II දරන ලිපිය

පරුමකන-පුත-අසලියලෙණෙ අගත-අනගත-චතුදිසික-සගයෙ

iii) පහත වර්තමාන සරල බසින් දක්වා ඇති ලේඛන ක්‍රි.පූ. 3-1 අතර අක්ෂර භාවිතයෙන් පෙළ ලියා දක්වමින් එහි සිංහල පෙළ ද ලියා දක්වන්න.

මිහින්තලේ අංක 31 දරන ලිපිය

ගාමණී තිස්ස මහරජුගේ භාර්යාව වූ උපාසිකා රාමදත්තාගේ ලෙණ සංඝයාට

02. ඉතිහාසකරණයේ දී අවිඥාණික මූලාශ්‍රයක් ලෙස අභිලේඛනයන්හි වැදගත්කම පෙන්වා දෙන්න.

03. ශ්‍රී ලාංකේය ආර්ථික ඉතිහාසය ගොඩනැංවීමේ දී අභිලේඛනයන්හි උපයෝගීතාව සහේතුකව පැහැදිලි කරන්න.

04. අනුරාධපුර සමයට අයත් අභිලේඛනයන්හි දැක්වෙන "කුල" යන පදය විග්‍රහ කරන්න.

05. කහාපනයන්හි ඇති සංකේත ඇඳ දක්වමින් එම සංකේත පිළිබඳව ඇති මත පෙන්වා දෙන්න.

06. අනුරාධපුර රාජ්‍ය සමයෙහි කාසි සමග බැඳි සංස්කෘතික සංකල්ප සාකච්ඡා කරන්න.

07. ශ්‍රී ලංකාවෙන් හමුවන රන්කාසි ඇඳ දක්වමින් අන්තර්ගත සංකේත විස්තර කරන්න.

08. පුරාවිද්‍යාඥයෙකු නාණක විද්‍යාව හැදෑරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

*************************************